The Robert H. N. Ho Family Foundation Global

ACLS | American Council of Learned Societies

# රොබට් එච්. එන්. හෝ ගෝලීය පවුල් පදනම
# 2025-26 බෞද්ධ අධ්‍යයන ශිෂ්‍යාධාර සහ ප්‍රතිපාදන සඳහා වන තරඟ

American Council of Learned Societies (ACLS) විසින් රොබට් එච්. එන්. හෝ පවුල් පදනමේ බෞද්ධ අධ්‍යයන වැඩසටහන සඳහා වන 2025-26 තරඟ සඳහා සඳහා අයදුම්පත් කැඳවනු ලබයි. මෙම පදනම සමඟ සහයෝගයෙන්, ශාස්ත්‍රීය අධ්‍යයනය සහ සමාජය තුළ බෞද්ධ චින්තනය පිළිබඳ ඇති අවබෝධය සහ අර්ථ නිරූපණය පුළුල් කිරීම, බෞද්ධ විද්වතුන්ගේ අන්තර්ජාතික සම්බන්ධතා ශක්තිමත් කිරීම සහ බෞද්ධ සම්ප්‍රදායන් පිළිබඳ නව දැනුම හා පර්යේෂණවල දෘශ්‍යතාව වැඩි කිරීම සඳහා ACLS විසින් ශිෂ්‍යාධාර සහ ප්‍රතිපාදන පිරිනමනු ලබයි.

මේවා ගෝලීය වශයෙන් පවත්වන තරඟ වේ. බෞද්ධ සම්ප්‍රදායන් හා සම්බන්ධ ඕනෑම අංශයක අධ්‍යයනයක නියැලී සිටින ලෝකයේ ඕනෑම තැනක සිටින සියලුම විද්වතුන් හට මේ සඳහා අයදුම් කළ හැක. සත්කාරක සංවිධානයේ රට තුළ සේවා අවසරය අවශ්‍ය වන බුද්ධාගම සම්බන්ධ මහජන විද්වතුන් හැරුණු විට, යෝජිත කාර්යය සිදුකරන ස්ථානය හෝ අයදුම්කරුවන්ගේ පුරවැසිභාවය සම්බන්ධයෙන් කිසිදු සීමාවක් නොමැත.

**විශේෂයෙන්ම ආසියාවේ විශ්වවිද්‍යාල සහ පිරිවෙන් ආයතනවලට අනුබද්ධ විද්වතුන් හට මේ සඳහා අයදුම් කළ හැක.**

අයදුම්පත් ඉංග්‍රීසියෙන් ඉදිරිපත් කළ යුතු නමුත් පර්යේෂණයේ අවසාන නිමැවුම ඕනෑම භාෂාවකින් විය හැකිය. යෝජිත කාර්යය මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යාවන් යන ක්ෂේත්‍ර තුළ විය යුතුය .

**පහත තරඟ සඳහා අවසාන දිනය 2025 නොවැම්බර් 20 වන දින නැගෙනහිර සම්මත වේලාවෙන් (EST) පස්වරු 9:00 වේ:**

- බෞද්ධ අධ්‍යයන නිබන්ධන ශිෂ්‍යාධාර
- බෞද්ධ අධ්‍යයන මුල් කාලීන වෘත්තීය පර්යේෂණ ශිෂ්‍යාධාර
- බෞද්ධ අධ්‍යයන මහජන බලපෑම් ප්‍රතිපාදන

**පහත තරඟ සඳහා අවසාන දිනය 2026 ජනවාරි 27 වන දින නැගෙනහිර සම්මත වේලාවෙන් (EST) පස්වරු 9:00 වේ:**

- බුද්ධාගම මහජන විද්වතුන්
- බෞද්ධ අධ්‍යයන නව මහාචාර්ය පදවි

**වැඩසටහන සහ හිමිවන ප්‍රතිපාදන පිළිබඳ පොදු තොරතුරු සඳහා පිවිසෙන්න:**
https://www.acls.org/programs/robert-h-n-ho-family-foundation-in-buddhist-studies/

**වෙබිනාර් සහ වැඩමුළු පිළිබඳ තොරතුරු සඳහා:**
https://www.acls.org/resources/informational-webinars-and-office-hours-for-2025-26-acls-fellowships-and-grants/

**නිතර අසන ප්‍රශ්න:**
https://www.acls.org/faqs/faq-the-robert-h-n-ho-family-foundation-program-in-buddhist-studies/